මාතලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට ප්‍රතිපූර්ණය වියයුතු හිඟ වැටුප් රු.9,596,044 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ). වර්ෂයේ බැකෝ යන්ත්‍රය කුලියට දීමේ ආදායම රු.52,950 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ). වර්ෂය තුල මිලදී ගෙන තිබුණු, රු.6,500 ක් වටිනා බුමුතුරුණුවක් ගිණුම්ගත නොකිරීම හා කාර්යාල මේස 02 ක වටිනාකම රු.7,457 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.13,957 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ). වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම සහ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.724,150ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ). කට්ටිකර විකුණු ලොග් නගර් වත්ත ඉඩමෙන් පොදු පහසුකම් සඳහා 2014 මැයි 02 දින සභාවට පවරා ගෙන තිබූ රු.100,000 ක් වටිනා ඉඩම් කොටසෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.27,607,825ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.208,495 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

----------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 09ක වටිනාකම වූ රු.29,966,961 ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.1,016,407ක ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

ගෙවිය යුතුව තිබූ ණයහිමි ගිණුම් ශේෂ 10ක වටිනාකම රු.13,651,564ක් වූ අතර, වර්ෂ 03 කට වැඩි කාලයක් ඉක්මවූ රු.3,739,845ක ශේෂ ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-------------------------------------

අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 02කට අදාල එකතුව රු.475,078 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,480,163 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,288,566 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,191,597 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ජල ගාස්තු

-------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.4,615,301ක් වූ අතර, එම ශේෂය තුල, 2010,2012 හා 2014 වර්ෂවල සිට අක්‍රියව පවතින ජල යෝජනා ක්‍රම 04කට අදාලව රු.1,089,541ක හිඟ ශේෂයක් වූ අතර, ජල බිල්පත් නොගෙවීම මත 2012, 2013 හා 2014 වර්ෂයන්හිදී විසන්ධි කරන ලද ජල යෝජනා ක්‍රම 08 කට අදාල ජල පාරිභෝගිකයින් 214 දෙනෙකුගෙන් අයවියයුතු රු.820,318 ක හිඟ ජල ගාස්තු ශේෂයක් ද විය.

(ආ) ජල මනු අක්‍රියවී තිබූ ජල පාරිභෝගිකයින්ගෙන් දිගින් දිගටම රු.300ක මාසික අවම ස්ථාවර ගාස්තුව අයකර තිබුණු අතර, නව ජල මනු සවිකර පරිභෝජනය කළ ජල ඒකක ප්‍රමාණය මත ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. නියැදියක් ලෙස ජල යෝජනා ක්‍රම 05ක ජල පාරිභෝගිකයින් 42ක් සම්බන්ධව ජල මනු ක්‍රියාත්මක නොවීම මත රු.300ක මාසික ගාස්තුවක් අයකර තිබුණි.

2.2.2 වරිපනම් බදු

------------

රු.909,396ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවති අතර, ඒ සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.227,025ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි.

2.2.4 වෙනත් ආදායම්

-----------------

2013 නොවැම්බර් 29 දිනැති අංක 1838/55 දරන පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකළ අතුරු ව්‍යවස්ථාවේ iv (අ) කොටස විධිවිධාන ප්‍රකාරව සභාව සතු පාරවල් හා මංමාවත්වල බර වාහන සීමා කිරීමේ ගාස්තු අයකිරීම් යටතේ කළුගල් හා ඩොලමයිට් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනය කෙරෙන වාහන වලින් 2015 වර්ෂය සඳහා ගාස්තු අයකර නොතිබුණි.
වාහන නවතා තැබීමේ ගාස්තු රු.17,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.987,347ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.17,481,140ක මුදලක් අයවිය යුතුව තිබුණි. මින් 2016 මැයි 26 දින වන විට තවදුරටත් අයවිය යුතුව තිබූ උසාවි දඩ රු238,532 ක් සහ මුද්දර ගාස්තු රු12,592,500 ක් විය.

2.3 අධිභාර

-----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාලව රු.1,426,708 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ පුරප්පාඩු නොතිබුණු තනතුරු 07 ක් සඳහා 2014 නොවැම්බර් මස සේවකයින් බඳවා ගැනීම නිසා අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 14 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) සභා තීරණයක් මත 2011 වර්ෂයේ සිට ජල මනු කියවන්නෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ අතර, තනතුරේ අවශ්‍යතාවය සලකා එම තනතුර කාර්ය මණ්ඩලයට ස්ථිර සේවක තනතුරක් ලෙස අනුමත කර ගැනීමට කටයුතු නොකර සභා අරමුදලින් රු.348,427ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) වෙළඳ බලපත්‍ර ලේඛනය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළයුතු ව්‍යාපාර 85 න් ව්‍යාපාර 64 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ඈ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 95/9 දරන 1995 දෙසැම්බර් 27 දිනැති ගිණුම් චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 9 දෙනෙකුගෙන් අයවියයුතු රු.10,097 ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647 (අ) නියමය පරිදි වාහන සහ උපකරණ පිළිබඳව සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඊ) සභාවට අයත් පලාපත්වල මහජන පුස්තකාලයේ 2015 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබූ සමීක්ෂණය අනුව රු.7,342 ක් වටිනා පොත් 82 ක ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි .

3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියෙන් ඉඩදී නොමැති පෙරපාසැල් නිල ඇඳුම් හා නිල ඇඳුම් ඇසුරුම්කරණ ලබාදීම, දිනපොත් මුද්‍රණය, මන්ත්‍රීවරුන්ට අත්සන් පෑන් ලබාදීම වැනි කාර්යයන් සඳහා අවස්ථා 04කදී රු.457,321ක් වැයකර තිබුණි.

(ආ) 2015 මැයි මස 13 දින සභාව විසුරුවා හැර තිබුණු නමුත්, සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරුන්ට මැයි මාසය සඳහා සම්පූර්ණ මාසික දීමනාවම ගෙවා තිබීම හේතුවෙන් මන්ත්‍රීවරුන් 18 දෙනෙක් සඳහා රු.170,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සතියේ වැඩ කරන දිනයන් සඳහා නිවාඩු දින වැටුප් ගෙවිය නොහැකි වුවත්, සභාව මඟින් පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේදයේ, වෛද්‍යවරයාගේ පුරප්පාඩුව සඳහා සතියට දින 02ක් තැන්න ආයුර්වේද මධ්‍යස්ථානයේ වෛද්‍යවරු දෙදෙනෙකුගේ සහාය ලබාගෙන එම වෛද්‍යවරුන්ට මූලික වැටුපෙන් 1/30ක නිවාඩු දින වැටුප් රු.74,584 ක් ගෙවා තිබුණි.

3.3 බලය නොලත් ගනුදෙනු

----------------------------

(අ) විධිමත් අනුමැතියක් නොමැතිව ජල පාලකවරු 08 දෙනෙකු බඳවාගෙන 2015 වර්ෂය තුලදී රු.406,064 ක දීමනාවක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ස්ථිර පත්වීම් ලබාදී තිබූ සේවකයින් 35 දෙනාට අමතරව දින 180 සම්පූර්ණ වී නොතිබුණු සේවකයින් 05 දෙනෙකුට හා නැවත අනියම් පදනම මත බඳවාගත් සේවකයින් 04 දෙනෙකුට වර්ෂය තුලදී දීමනා ලෙස රු.1,352,753 ක් ගෙවා තිබුණි.

(ඇ) මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2012 මාර්තු 23 දිනැති අංක 3/2/2/4 දරන ලිපිය ප්‍රකාරව මන්ත්‍රීවරුන් සඳහා අදාල පළාත් පාලන ආයතනයේ අරමුදලින් ප්‍රතිපාදන දැරීමේ පදනම මත මාසිකව රු.1,000 ක දුරකථන දීමනාවක් පමණක් ගෙවීම අනුමත කර ඇතත්, සභාවේ උප සභාපතිවරයාගේ නිවාස දුරකථනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා කාලය සඳහා එම සීමාව ඉක්මවා රු.17,223 ක් ගෙවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත දැක්වෙන කරුනු නිරීක්ෂණයකරනු ලැබේ.

3.4.1 සංවර්ධන සැලසුම්වල ඇතුළත් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම.

----------------------------------------------------------------------

2015 වර්ෂය සඳහා සකස් කර තිබුණු සංවර්ධන සැලැස්මේ ඇතුළත් එකතු වටිනාකම රු. 9,800,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 41 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4.2 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන
---------------------------------------------------

2015 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ අනුමත රු.6,000,000 ක ප්‍රතිපාදන වලින් ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ නමුත්, රු.3,500,000 ක් වූ ව්‍යාපෘති 10 ක් ඉටුකර නොතිබුණි.

3.4.3 රත්මල්ගහ ඇල උකුවෙල ඇලවේල්ල පිළිසකර කිරීම
-----------------------------------------------------------

නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය මඟින් දින 100 වැඩසටහනට සමගාමීව ගම් නගා සිටුවීමේ වැඩ සටහන - 2015 යටතේ රු.380,609 ක් වැයකර ඉදිකර තිබූ රත්මල්ගහ ඇල උකුවෙල ඇලවේල්ල පිළිසකර කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 02 ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් ඝන මීටර 24.5 ක කොන්ක්‍රීට් බැම්මක් ඉදිකළ යුතු වුවද, ඉදිකර ඇති කොන්ක්‍රීට් බැම්ම ඝන මීටර 15.26 ක් විය. නියමිත ප්‍රමාණයට කොන්ක්‍රීට් බැම්ම ඉදි නොකිරීම හේතුවෙන් කුඹුරුයායට ගංවතුර ගැලීම පාලනය වී නොතිබූ බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොති බව 2016 අප්‍රේල් 07 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය.

3.4.4 කවටයාමුණ ප්‍රජා ශාලාව ඉදිකිරීම
----------------------------------------

ගම් නගා සිටුවීමේ වැඩසටහන 2015 යටතේ කවටයාමුණ ප්‍රජා ශාලාව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.683,680 ක් වැය කර තිබූ අතර, ඇස්තමේන්තුවේ / නිම්වැඩ වාර්තාවේ වැඩ විෂය අංක 10 යටතේ විශේෂ තත්ත්වයේ ඝනකම කොස් දැව යොදා යුනියන් ලොක් හා ඉහලම තත්ත්වයේ සරනේරු භාවිතා කර උසස් නිමාවකින් යුතුව දොරක් නිම කිරීම සඳහා වර්ග මීටරයකට රු.17,371 බැගින් වර්ග මීටර 1.89 ක් සඳහා රු.32,831 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එහෙත් ලෑලි අතර, අඟල් ¼ - ½ ක් අතර ප්‍රමාණයේ පරතරයන් පවතින ආකාරයට මෙම දොරෙහි ලෑලි සවිකර තිබුණු බැවින් ඇස්තමේන්තුවේ සඳහන් පරිදි උසස් තත්ත්වයේ නිමාවකින් යුතුව එම වැඩ විෂය නිමකර නොතිබුණි.

3.4.5 නිකවෙල සී කොටස වට රවුම් පාර සංවර්ධනය කිරීම
-----------------------------------------------------------

ගම් නගා සිටුවීමේ වැඩසටහන 2015 යටතේ නිකවෙල සී කොටස වට රවුම් පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.489,410 ක් වැයකර තිබුණි. අනුමත ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 9 යටතේ මාර්ගතලය දෙපස පස් පුරවා සකස් කිරීම සඳහා ඝනමීටර එකකට රු. 2,005.15 බැගින් ඝනමීටර 6.80ක් සඳහා රු.13,635ක මුදලක් ඇතුළත්කර එම වැඩ විෂය නිම කළ බවට නිම්වැඩ වාර්තාවේ දක්වා ඇස්තමේන්තුගත මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ නමුත් මාර්ගතලය දෙපස පස් පුරවා සකස් කර නොතිබුණු බව 2016 මාර්තු 30 දිනැතිව සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.4.6 පඬිවිට වෙලගම කෘෂි මධ්‍යස්ථානය ඉදිකිරීම
--------------------------------------------------

පොදු අරමුදල් යටතේ පඬිවිට වෙලගම කෘෂි මධ්‍යස්ථානය රු.981,000 ක මුදලකට ඉදිකිරීම සඳහා ගොවි සංවිධානයක් සමඟ 2015 පෙබරවාරි 19 දින ගිවිසුම්ගතව රු.327,933 ක මුදලක් වැයකර තිබූ නමුත් ගිවිසුම්ගතව තිබූ වැඩ විෂයයන් 15 න් වැඩ විෂයයන් 8 ක් පමණක් නිමකර 2015 මාර්තු 02 දින ව්‍යාපෘතිය භාරදී තිබුණි. කොන්ත්‍රාත්කරු ගිවිසුම් ප්‍රකාරව වැඩ නොකිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ නිම නොකළ වැඩ විෂයයන් නිමකිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු කර නොතිබුණු බැවින්, නිරවුල් කළ බිල්පත් වටිනාකම වූ රු.327,933 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කෙරෙන කසළ පලාපත්වල ඉදිකර ඇති කොම්පෝස්ට් අංගනයේ දී කම්කරුවන් 04 දෙනෙකු යොදවා තේරීම් කර, දෛනිකව කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 400ක් පමණ නිෂ්පාදනය කරනු ලැබේ. එකතු කරන කසළ වලින් සියයට 40ක ප්‍රමාණයක් වන පොලිතින් බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර, පස් දමා වැසීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

----------------------------

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). දීප ව්‍යාප්ත තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම පෙරදැරිව ඉ - ශිල්පාගාර ව්‍යාපෘතිය යටතේ විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයෙන් පරිගණක 40 ක්, පුටු 40 ක්, මේස 40ක් හා ප්‍රොජෙක්ටරයක් 2014 දෙසැම්බර් 10 දින ලබා දී තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා අදාල භාණ්ඩ නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) වටිනාකම රු.30,000 ක් වූ අංක 111 – 3207 දරන යතුරුපැදිය වසර 3කට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ප්‍රාදේශීය සභා භූමියේ ගාල්කර තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ). ආදායම් විෂයයන් 32 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර, සියයට 10 සිට 99 අතර පරාසයක විචලනයන් පැවති අතර, ඇස්තමේන්තුගත ටෙන්ඩර් කුලී ආදායම රු.22,000,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී ටෙන්ඩර් කුලී ආදායම් කිසිවක් අයකර ගැනීමට සභාව සමත් වී නොතිබුණි.

(ආ). වැය විෂයයන් 26 ක් සඳහා සලසාදී තිබූ රු.3,340,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 77ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 05 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) අය වැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමණාකරණය
(ඊ) වාහන පාලනය
(උ) ණයගැති හා ණය හිමි පාලනය
(ඌ) කොන්ත්‍රාත් පාලනය
(එ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය